

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education



අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

13 ශ්‍රේණිය	24	S	I	තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය I	කාලය : පැය දෙකයි Time : Two hours

උපදෙස් :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වේ.
- එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.

සැලකිය යුතුයි:

* මෙම ප්‍රශ්න පත්‍රයෙහි තාර්කික නියත හා කර්මයන් සඳහා සංකේත භාවිත වන්නේ පහත දැක්වෙන ආකාරයට පමණි. පිළිතුරු සැපයීමේ දී ඒ අනුව සංකේත භාවිත කළ යුතු ය.

ප්‍රස්තුත හා ආඛ්‍යාත කලනයේ දී:

නිෂේධනය : $\sim$, ගම්‍යය : $\rightarrow$, සංයෝජකය : $\wedge$, වියෝජකය : $\vee$, උභයගම්‍යය : $\leftrightarrow$,

සර්වවාචී ප්‍රමාණීකෘතය : Λ, අස්තිවාචී ප්‍රමාණීකෘතය : V

වර්ග තර්ක ශාස්ත්‍රයේ දී:

A, B යන වර්ගයන්ගේ මේලය: $A \cup B$, ඡේදනය: $A \cap B$ හෝ AB, A වල අනුපූරකය: $\bar{A}$, විශ්ව වර්ගය: U, ශූන්‍ය වර්ගය: ϕ

බූලීය වීජ ගණිතයේ දී:

ඓක්‍යය: $+$, ගුණිතය: $\cdot$, X වල අනුපූරකය: $\overline{X}$, අගයන්: 1 සහ 0

තර්ක ද්වාරවල දී:

AND, OR, NOT, XOR ද්වාර පිළිවෙළින් A හා B ආදාන සඳහා $A \cdot B, A+B, \bar{A}, A \oplus B$ ලෙස දැක් වේ.

01. සප්‍රමාණ තර්ක අතර දැකිය නොහැක්කේ,
(1) අවයව සත්‍ය නිගමනය සත්‍ය තර්ක
(2) අවයව අසත්‍ය නිගමනය සත්‍ය තර්ක
(3) අවයව සත්‍ය නිගමනය අසත්‍ය තර්ක
(4) අවයව අසත්‍ය නිගමනය අසත්‍ය තර්ක
(5) නිවරදි පිළිතුරක් නොමැත.

02. පොපෙරියානු අර්ථයෙන් පහත දැක්වෙන කුමක් විද්‍යාවක් වන්නේ ද?
(1) ආධ්‍යාත්ම විද්‍යාව
(2) සෞන්දර්ය විද්‍යාව
(3) ශුද්ධ ගණිතය
(4) කායික විද්‍යාව
(5) පාර මනෝ විද්‍යාව

03. සාම්ප්‍රදායික වර්ග තර්කයෙහි ප්‍රස්තුතයක සාධක දෙකක් වන්නේ,
(1) සත්‍ය හා සප්‍රමාණතාවයි.
(2) ඒකවාචී සර්වවාචී.
(3) වාච්‍ය හා වාචකයයි.
(4) අවයව හා නිගමනයයි.
(5) සප්‍රමාණ හා නිෂ්ප්‍රමාණ බවයි.

04. පහත කුමන අදහසක් සාපේක්ෂකවාදී ආකල්පයක් වන්නේ ද?
(1) විද්‍යාව, බුද්ධිය හා ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය මත වඩාත් සත්‍ය කරා මෙහෙයවන ඥානයකි.
(2) නිරීක්ෂණ භාෂාව වාද හරිත නොවේ.
(3) ඉන්ද්‍රිය අනුභූතිය දත්ත සියල්ලන්ටම පොදු ය.
(4) විද්‍යාව පදනම් වාදයකට සාපේක්ෂව ගොඩ නැගුණු ඥානයකි.
(5) වාද අනුක්‍රමයක මුල් වාදය හා පසු වාදය අතර සංගත හා සම්මේයතාවක් පවතී.

05. තර්ක ශාස්ත්‍රයෙහි අමුර්ත ස්වභාවය යනු,
(1) අවයව කෙරෙන් නිගාමී ලෙස නිගමනයන් ගම්‍ය වීමයි.
(2) තාර්කික හැදෑරීම රූපයක් සහිත වස්තූන්ගෙන් පරිබාහිරව සිදු වන බවයි.
(3) තාර්කික හැදෑරීම් ද්‍රව්‍යාත්මක වස්තූන් සමඟ සෘජුව සම්බන්ධවන බවයි.
(4) තාර්කික මෙහෙයුම් තුළ ඇත්තේ උද්ගාමී හා නිගාමී දෙකෙහි එකතුවක් බවයි.
(5) සප්‍රමාණ තර්කයක අවයව කෙරෙන් නිගමනය නිශ්චිතව ගම්‍ය වන බවයි.

06. පොල්ගස තුළ මයිටා නැමති දිලීර ජාල තිබෙන බව පරීක්ෂණයට භාජනය විය. මෙහිදී දිලීරය වැඩිම නිසා පොල්ගසෙහි කොළ කහ පැහැති වූවාද? නැත්නම් ශාකයේ කොළ කහ පැහැති වූ නිසා ඒ මත දිලීරය වැඩුණා ද යන්න නිගමනය කිරීමට වඩාත් යෝග්‍ය වන්නේ,
(1) පාලිත කණ්ඩායම් පරීක්ෂණය
(2) දුර්නිරීක්ෂණය
(3) නිර්ණය පරීක්ෂණය
(4) ස්වභාවික නිරීක්ෂණය
(5) පරමාදර්ශී සම්පරීක්ෂණය

07. “273K උෂ්ණත්වයේ දී හිම මිදීම සිදුවේ.” යන ප්‍රකාශය,
(1) තදාත්ම්‍ය නියමයට අදාළ ය.
(2) විසංවාදී මූලධර්මයට අදාළ ය.
(3) ද්විත්ව ප්‍රතිලෝම නියමයට අදාළ වේ.
(4) පර්යාප්ත හේතු මූලධර්මයට අදාළ වේ.
(5) නිර්මධ්‍ය මූලධර්මයට අදාළ වේ.

08. 1 2 3 4 5 6 7 8 9 10 යන අංකවල මධ්‍යන අපගමනය වූයේ,
(1) 2 (2) 3 (3) $2\frac{4}{5}$ (4) $2\frac{1}{2}$ (5) $1\frac{1}{5}$

09. I ප්‍රස්තුතයක අසත්‍යතාව මත ඊට අනුරූප A, E, O යන ප්‍රස්තුතයන්ගේ සත්‍යතා අගයන් කවරාකාර ද?
(1) අසත්‍ය, සත්‍ය, අසත්‍ය
(2) අසත්‍ය, අසත්‍ය, අවිනිශ්චිත
(3) අසත්‍ය, අවිනිශ්චිත, සත්‍ය
(4) අසත්‍ය, සත්‍ය, සත්‍ය
(5) අසත්‍ය, අසත්‍ය, සත්‍ය

10. විද්‍යාවේ න්‍යායාත්මක පදයක් වන්නේ,
(1) වාදයක එන අධිභෞතික පදයකි.
(2) ඕනෑම විද්‍යාත්මක වාදයක හෝ නියමයක පදයකි.
(3) තහවුරු කරන ලද හෝ අසත්‍යකරණය කරන ලද විද්‍යාත්මක වාදයක හෝ නියමයක පදයකි.
(4) ඕනෑම විද්‍යාත්මක උපන්‍යාසයක එන පදයකි.
(5) විද්‍යාත්මක වාදයක් තුළ සෘජුවම නිරීක්ෂණය කළ නොහැකි අනුමාන කරනු ලබන ප්‍රපංචයක් සඳහා යොදා ගැනෙන පදයකි.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

11. "සියළු ළමයින් උද්යෝගිමත් ය" යන ප්‍රස්තුතයේ පංගු පරිවර්තනය කුමක් ද?
    (1) සමහර ළමයින් උද්යෝගිමත් වේ.
    (2) සමහර උද්යෝගිමත් අය ළමයින් වේ.
    (3) සියළු උද්යෝගිමත් අය ළමයින් වේ.
    (4) කිසිම උද්යෝගිමත් අයෙක් ළමයෙක් නොවේ.
    (5) සියළු උද්යෝගිමත් අය ළමයින් නොවන්නේ නොවේ.

12. පහත දැක්වෙන අංක අනුක්‍රමවල පරාසයන්හි මධ්‍යස්ථය කීයද?
    5, 1, 10, 98
    78, 33, 13, 20
    65, 110, 19, 37
    36, 9, 19, 27
    (1) 65 (2) 91 (3) 78 (4) 46 (5) 54

13. නිල් පාට මොණරුන් සියළු දෙනා පිල් විදහා නටති. සියළු මොණරුන් නිල් පාට වෙති. එහෙයින් සියළු මොණරුන් පිල් විදහා නටති, යන සංවාක්‍ය තර්කය,
    (1) සප්‍රමාණ වේ.
    (2) අයථා පක්ෂ පද ආභාසය හටගෙන ඇත.
    (3) චතුස්පද ආභාසය හටගෙන ඇත.
    (4) අයථා සාධ්‍ය පද ආභාසය හටගෙන ඇත.
    (5) අව්‍යාප්ත මධ්‍ය පද ආභාසය හටගෙන ඇත.

14. හැඩින් සහ C.G.සෙලිග්මාන් විසින් නිව්ගිනියාවේ කරන ලද මානව විද්‍යාත්මක අධ්‍යනය,
    (1) සංඛ්‍යාතමය විශ්ලේෂණයයි.
    (2) නිරීක්ෂණය හා සහභාගිත්ව නිරීක්ෂණයයි.
    (3) තාර්කික විශ්ලේෂණයයි.
    (4) කාබන් 14 කාල නියම පරීක්ෂණය උපයෝගී කර ගත් පොසිල අධ්‍යනයයි.
    (5) සම්පරීක්ෂණාත්මක පර්යේෂණයයි.

15. සප්‍රමාණ තර්ක ආකෘතියක් වන්නේ පහත කවරක් ද?
    (1) $(P \rightarrow Q) \wedge (P \rightarrow R)$
    $\sim P$
    $\therefore (\sim Q \vee \sim R)$

    (2) $(P \rightarrow Q) \wedge (Q \rightarrow R)$
    $(Q \vee R)$
    $\therefore P$

    (3) $(P \rightarrow Q) \wedge (R \rightarrow S)$
    $(Q \vee R)$
    $\therefore (P \vee R)$

    (4) $(\sim P \rightarrow \sim Q) \wedge (R \rightarrow S)$
    $(Q \vee \sim S)$
    $\therefore (P \vee \sim R)$

    (5) $(\sim P \rightarrow Q) \wedge (\sim P \rightarrow R)$
    $(\sim Q \vee R)$
    $\therefore P$

16. උද්ගමනයට පටහැනිව ඩෙවිඩ් හියුම් මතු කළ තර්කයෙහි හරය වූයේ,
    (1) විද්‍යාවට නිගාමී තර්කයක් පදනම් කරගත යුතු බවයි.
    (2) උද්ගමනය සමර්ථනය කිරීමට යොදා ගන්නා තර්කය චක්‍රක දෝෂයෙන් යුතු බවයි.
    (3) විද්‍යාව ආනුභූතික කරුණු මඟින් නිගමන ලබා ගැනීම වරදක් බවය.
    (4) අනාවැකිය සත්‍ය වූ පමණින්ම උපන්‍යාසය සත්‍ය යැයි නිගමනය කිරීම වරදක් බවයි.
    (5) සාමාන්‍යයෙන් ගණනයෙන් කරන උද්ගමනයට සීමාවන් නොමැති බවයි.

17. පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) දෙවන ප්‍රකාරයේ සංවාක්‍යයක් තුළ අවයව දෙකම ප්‍රතිජානන විය නොහැකිය.

(2) තෙවන ප්‍රකාරයේ සංවාක්‍යයක් තුළ සාධ්‍ය අවයවය විශේෂ ප්‍රතිජානන විය හැකිය.


(3) සිව්වන ප්‍රකාරයේ සංවාක්‍යයක් තුළ සාධ්‍ය අවයවය අනිවාර්යයෙන්ම සර්වවාචී විය යුතුය.

(4) පළමු ප්‍රකාරයේ සංවාක්‍යක සාධ්‍ය අවයවය විශේෂ නම් පක්ෂ අවයවය ප්‍රතිශේධාත්මක විය යුතුය.


(5) තෙවන ප්‍රකාරයේ සංවාක්‍යක නිගමනය විශේෂ ප්‍රස්තුතයක් විය යුතුමය.

18. වස්තුවකට යොදන බලය ඒකාකාර අගයකින් වැඩි කරන්නේ නම් චලිතය පිළිබඳ නිව්ටන්ගේ දෙවන නියමයට අනුව එහි ත්වරණය වෙනස් වන ආකාරය දක්වන ප්‍රස්තාරය කුමක් ද?


(1)




(2)




(3)



(4)



(5)



19. "සමහර ගැහැණු සිනහවෙති.
සිනහ වූ අයට ආපසු සිනහ ලැබේ.
එහෙයින් ගැහැණුන්ට ආපසු සිනහ ලැබේ."
යන සංවාක්‍ය

(1) අයථා පක්ෂ පද ආභාසය හටගෙන නිෂ්ප්‍රමාණ වේ.

(2) ද්විපද ආභාසය හටගෙන නිෂ්ප්‍රමාණ වේ.

(3) අයථා සාධ්‍ය පද ආභාසය හටගෙන නිෂ්ප්‍රමාණ වේ.

(4) අව්‍යාප්ත මධ්‍ය පද ආභාසය හටගෙන නිෂ්ප්‍රමාණ වේ.

(5) සප්‍රමාණ සංවාක්‍යයක් වේ.

20. අනුයාත ලක්ෂ දෙකක් අතර සමාන දුර ප්‍රමාණයන්ගෙන් සමාන වූ ප්‍රමාණාත්මක වෙනසක් දැක්වීම අනුපාත පරිමාණය සම්බන්ධයෙන්,

(1) ප්‍රමාණවත් කොන්දේසියකි.

(2) අවශ්‍ය කොන්දේසියකි.

(3) අවශ්‍ය මෙන්ම ප්‍රමාණවත් කොන්දේසියකි.


(4) අවශ්‍ය හෝ ප්‍රමාණවත් නොවේ.


(5) අවශ්‍ය නමුත් ප්‍රමාණවත් කොන්දේසියක් නොවේ.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


Past Papers Wiki


21. කිසිම විචාරකයෙකු විචාරශීලී නොවේ. දාර්ශනිකයින් නොවන සියළු දෙනා විචාරශීලී ය. එහෙයින් සියළු විචාරකයින් දාර්ශනිකයින් ය.
යන තර්කය නිවැරදිව රූප ගත කර ඇත්තේ කවරක ද?

(1) 

(2) 

(3) 

(4) 

(5) 

22. ලකටෝස් ඉදිරිපත් කරන විද්‍යාත්මක පර්යේෂණ වැඩපිළිවෙලහි සෘන ස්වෝතෝන්වේෂණය මගින් කරනු ලබන්නේ,

(1) විද්‍යාඥයා අධ්‍යයනය කළ යුතු මාර්ග දක්වයි.


(2) පර්යේෂණ වැඩසටහනට හානි කරන්නන් අනාවරණය කිරීමයි.

(3) පර්යේෂණ නොකළ යුත්තේ කවර පැති වලින් ද යන්න නිර්ණය කිරීමයි.

(4) සාක්ෂි නැතත් පර්යේෂණ වැඩසටහන අත්නොහැර පවත්වාගෙන යා යුතු බව යෝජනා කිරීමයි.

(5) කේන්ද්‍රීය හරය ආරක්ෂා කිරීමයි.

23. රූප සටහනේ පෙන්නුම් කරන A, B, C යන වර්ග



(1) කතා විශ්වය නිරවශේෂ නොකරයි.

(2) සමහර වර්ග ශූන්‍යය.

(3) වර්ග කිසිවක් ශූන්‍ය නොවේ.

(4) සමහර වර්ග ශූන්‍ය නොවේ.

(5) A, B, C ට පොදු වූ සාමාජිකයින් පමණක් සිටී.

24. විසිවන සියවසේ සාර්ථකව විද්‍යාත්මක පර්යේෂණ සඳහා ආකෘති උපයෝගී කරගනු ලැබුවේ පහත කුමන සොයාගැනීමක් හෝ නිපදවීමක් තුළ ද?
(1) පෙනිසිලින්
(2) DNA අණුවේ ව්‍යූහය
(3) පරමාණු බෝම්බය
(4) පරමාණු න්‍යෂ්ඨියෙහි ව්‍යූහය
(5) නෙප්චූන් ග්‍රහතාරකාව


25. (R→(Q→P)), (Q→R)∴(Q→P)
යන තර්කයෙහි සප්‍රමාණතාව සත්‍ය වක්‍ර වක්‍ර ක්‍රමයෙන් නිගමනය කිරීමේ දී ලැබෙන නිවැරදි සත්‍යතා ඇගයුම් පෙළ කුමක් ද?

(1) TTFTFTTTTF TFF
(2) FTTTFTTTF T TFF
(3) FTTFFTTTTF TFF
(4) TFTFFTTTTF TFF
(5) TTTFF TTTTF TFF


26. විශේෂ ප්‍රපංචයක් ව්‍යාඛ්‍යානය කිරීමට කාර්ල් හෙම්පල් ගේ නිගාමී නීතිවේදිමය ව්‍යාඛ්‍යාන ව්‍යූහයට අවශ්‍ය කරුණක් වන්නේ,
(1) නිරීක්ෂණයන්ය.
(2) සම්පරීක්ෂණයන් ය.
(3) සඛ්‍යාතමය විශ්ලේෂණ යොදා ගැනීමයි.
(4) වර්ගීකරණයන් හා සාදෘශ්‍යයන්ය.
(5) යටත් පිරිසයින් ඒ සාර්වත්‍රික නියමයන් ය.

27. (P→Q).((P ∧ Q) →R) ∴ (P→R) යන තර්කයේ නිවැරදි සත්‍යතා රුක වන්නේ,

(1)




(2)




අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


(3)



(4)



(5)



28. පහත සඳහන් ඒවා අතර මූලික භෞතික රාශියකට සම්බන්ධ ඒකකයක් නොවන්නේ කුමක් ද?
(1) මීටරය (2) කිලෝග්‍රෑමය (3) මවුල (4) කැන්ඩෙලා (5) සෙල්සියස්


29. "ගුරුවරියන් අතර ඉතා ආදරණීය මව්වරු සිටිති." යන ප්‍රකාශනය නිවැරදිව සංකේත කර ඇත්තේ,
(1) $\Lambda x\ (Fx \rightarrow (Gx \wedge Hx))$ (2) $\Lambda x\ (Fx \wedge (Gx \wedge Hx))$ (3) $\Lambda x\ (Fx \wedge Vx(Gx \wedge Hx))$
(4) $Vx(Fx \wedge (Gx \wedge Hx))$ (5) $Vx(Fx \wedge (Gx \vee Hx))$

30. කොළ 52 ක් ඇති කාඩ් කුට්ටමකින් අනුක්‍රමයෙන් කොළ 2 ක් ඉවතට ගනියි.
(ප්‍රතිෂ්ඨාපන රහිතව) ඉදින් එවිට ඉවතට ගත් කොළ දෙක ආසියෙකු හා රජෙකු වීමේ සම්භාවිතාව කුමක් ද?
(1) 2/663 (2) 1/222 (3) 8/663 (4) 1/663 (5) 2/52


31. $\Lambda x\ (Fx \leftrightarrow Gx)\ .\ \Lambda xFx.\ \Lambda x(Gx \rightarrow Hx) \therefore Vx(Fx \wedge Hx)$

යන තර්කය රුක් ක්‍රමයෙන් විසඳූ විට සදොස් රුක් වන්නේ,


(1)




(2)




(3) $\Lambda x(Fx \leftrightarrow Gx)$
$\Lambda x\ Fx$
$\Lambda x(Gx \rightarrow Hx)$
$\sim V x(Fx \wedge Hx)$
$\Lambda x \sim(Fx \wedge Hx)$
Fx
$(Gx \rightarrow Hx)$
$(Fx \leftrightarrow Gx)$
$\sim(Fx \wedge Hx)$



(4) $\Lambda x(Fx \leftrightarrow Gx)$
$\Lambda x\ Fx$
$\Lambda x(Gx \rightarrow Hx)$
$V x(Fx \wedge Hx)$
$(Fx \wedge Hx)$
Fx
Hx
Fx
$(Gx \rightarrow Hx)$
$(Fx \leftrightarrow Gx)$



(5) $\Lambda x(Fx \leftrightarrow Gx)$
$\Lambda x\ Fx$
$\Lambda x(Gx \rightarrow Hx)$
$\sim V x(Fx \wedge Hx)$
Fx
$\Lambda x \sim(Fx \wedge Hx)$
$(Fx \leftrightarrow Gx)$
$(Gx \rightarrow Hx)$
$\sim(Fx \wedge Hx)$



32. නිර්ණය පරීක්ෂණය හා එහි ක්‍රියාමාර්ග සම්බන්ධව එකඟ විය නොහැකි කරුණ කුමක් ද?
(1) උපන්‍යාස දෙකක් එකිනෙකට විසංවාදී තාර්කික සංවිපාකයන් ගම්‍ය කර ගැනීම.
(2) පරීක්ෂණ ප්‍රතිඵල සමඟ විසංවාදී වන සංවිපාකයන් ගෙන දුන් උපන්‍යාස බැහැර කිරීම.
(3) නිර්ණය පරීක්ෂණයකින් ලැබෙන නිගමන දැඩි සංස්ථිතික බවක් ගැනීම.
(4) එකම ක්ෂේත්‍රයේ මතුව ඇති ගැටළුවකට තරඟකාරී උපන්‍යාස දෙකක් මතු වීම.
(5) පරීක්ෂණ ප්‍රතිඵල සමඟ ගැළපෙන අනාවැකි සහිත උපන්‍යාස නිවැරදි එකක් ලෙස නිර්ණය කිරීම.

33. $(\Lambda x \sim Fx \wedge (\sim GA \rightarrow VxFx)) \therefore Vy\ Gy$
යන තර්කය ව්‍යුත්පන්න කළ විට නිවැරදි ව්‍යුත්පන්නය වන්නේ,

(1) 1. ~~දක්වන්න~~ $Vy\ Gy$
2. $\sim Vy\ Gy$ (ව.ව.ළ.)
3. $(\Lambda x \sim Fx \wedge (\sim GA \rightarrow VxFx))$ (අවු.1)
4. $\Lambda x \sim Fx$
5. $(\sim GA \rightarrow VxFx)$ } (3 ට ති.රී)
6. $\Lambda y \sim Gy$ (2 ට ප්‍ර.නි.)
7. $\sim GA$ (6 ට ස.අ.)
8. $VxFx$ (3 ට 7 ට අ.ප්‍ර.රී)
9. $\sim Fx$ (4 ට ස.අ.)
10. Fx (8 ට අ.අ.)

(2) 1. ~~දක්වන්න~~ $Vy\ Gy$
2. $\sim Vy\ Gy$ (ව.ව්‍යු.ළ.)
3. $(\Lambda x \sim Fx \wedge (\sim GA \rightarrow VxFx))$ (අව.1)
4. $\Lambda x \sim Gy$ (2 ට ප්‍ර. නි)
5. $\Lambda x \sim Fx$
6. $(\sim GA \rightarrow VxFx)$ } (3 ට ස.කි.රී)
7. $\sim Fx$ (5 ට ස.අ.)
8. $Vx \sim Fx$ (7 ට අ.සා.)
9. GA (6 ට 8 ට නා.ප්‍ර.රී.)
10. $Vy\ Gy$ (9 ට අ.සා.)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(3) 1. ~~දක්වන්න~~ Vy Gy

2. ~ Vy Gy (ව.ව්‍යු.ඵ.)
3. (Λx ~Fx ∧ (~GA → VxFx)) (අව.1)
4. Λx~Fx
5. (~GA → VxFx) } (3 ට ස.කි.ඊ)
6. ~GA (2 ට අ.අ.)
7. VxFx (5 ට 6 ට අ.ප්‍ර.ඊ)
8. Fz (7 ට අ.අ.)
9. ~Fz (4 ට ස.අ.)

(4) 1. ~~දක්වන්න~~ Vy Gy

2. ~ Vy Gy (ව.ව්‍යු.ඵ.)
3. (Λx ~Fx ∧ (~GA → VxFx)) (අව.1)
4. Λx~Fx
5. (~GA → VxFx) } (3 ට ස.කි.)
6. ~ VxFx (4 ට ප්‍ර.නි.)
7. GA (5 ට 6 ට නා.ප්‍ර.ඊ.)
8. Vy Gy (7 ට අ.සා)

(5) 1. ~~දක්වන්න~~ Vy Gy

2. ~ Vy Gy (ව.ව්‍යු.ඵ.)
3. (Λx ~Fx ∧ (~GA → VxFx)) (අව.1)
4. Λx~Gy (2 ට ප්‍ර.නි.)
5. Λx ~Fx
6. (~GA → VxFx) } (3 ට ස.කි.)
7. ~GA (4 ට ස.අ.)
8. VxFx (6 ට 7 ට අ.ප්‍ර.ඊ.)
9. Fx (8 ට අ.අ.)
10. ~Fx (5 ට ස.අ.)

34. විද්‍යාත්මක මිනුමක ලක්ෂණයක් නොවන්නේ,
(1) සුතත්‍ය බව (2) වාස්තවික බව (3) ප්‍රමාණාත්මක බව
(4) සන්නිකර්ෂනයක් නොවීම (5) සාපේක්ෂ බව

35. ~Vx~(~Fx ∨ Gx)
~ Vx(Fx ∧ ~ Gx) යන සූත්‍ර

(1) විසංවාදී වේ.
(2) සංගත වේ.
(3) අසංගත වේ.
(4) සමානවත් විසංවාදීවත් නොවේ.
(5) සංගතවත් අසංගතවත් නොවේ.

36. විසිවන සියවසේ මුල් කාලයේ දී ගොඩනැඟුණු භෞතික විද්‍යා වාද දෙකක් වන්නේ පහත කවර ඒවා ද?

(1) සාපේක්ෂතාවාදය හා වායු පිළිබඳ වාලක වාදය
(2) සම්භාව්‍ය යාන්ත්‍රිකය හා ක්වන්ටම් යාන්ත්‍රණය.
(3) ක්වන්ටම් යාන්ත්‍රිකය හා පරමාණු වාදය
(4) ක්වන්ටම් වාදය හා ඔක්සිකරණය
(5) සාපේක්ෂතාවාදය හා ක්වන්ටම්වාදය.

37. අපරාධ නඩුවක දී අදාළ කරුණක් නොවන්නේ,
(1) සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කිරීම.
(2) සාධාරණ සැකයකින් තොර සාක්ෂි ඉදිරිපත් කිරීම.
(3) ස්වේච්ඡාවෙන්ම වරද කියා පෑම.
(4) වග උත්තර කරුගේ චරිතය
(5) ප්‍රතිබන්ධනය පිළිබඳ සිද්ධාන්තය.

38. විද්‍යාවේ සබුද්ධිකත්වය පිළිබඳ නීතියට දැඩි අභියෝගයක් එල්ල කළ විද්‍යාවේ ක්‍රමවේදය සම්බන්ධ දාර්ශනිකයෙකු වන්නේ පහත අයගෙන් කවුද?
(1) පෝල් ෆයරාබන්ඩ් (2) කාර්ල් පොපර් (3) කාර්ල් හෙම්පල්
(4) ඉම්රි ලකටෝස් (5) ඩේවිඩ් හ්‍යුම්

39. $\overline{A}B + AB + A\overline{B}$ යන බූලියානු ප්‍රකාශනයේ සුළු කළ සූත්‍රය වන්නේ,
(1) $\overline{A} + B$ (2) $A + B$ (3) $A + \overline{B}$ (4) $\overline{A} + \overline{B}$ (5) A

40. තාපගතික විද්‍යා ක්ෂේත්‍රයේ සුසමාදර්ශී පදනම් වාදයක් වශයෙන් සැලකිය හැකි වන්නේ පහත කුමක් ද?
(1) කැලරි වාදය
(2) තන්තු වාදය
(3) ඊතර් වාදය
(4) සමාන්තර විශ්ව පිළිබඳ න්‍යාය
(5) ගුරුත්වාකර්ෂණ වාදය

41.

A \ BC	00	01	11	10
0	1		1	1
1				1

ඉහත කානෝ සටහන අනුව නිවැරදිව ලබා ගත හැකි සරල සූත්‍රය වන්නේ,
(1) $\overline{A}C + \overline{A}B + B\overline{C}$
(2) $A\overline{C} + \overline{A}B + B\overline{C}$
(3) $\overline{A}\overline{C} + \overline{A}B + B\overline{C}$
(4) $\overline{A}\overline{C} + \overline{A}\overline{B} + AB$
(5) $\overline{A}\overline{B} + AC + A\overline{B}$

42. සෘජු නිරීක්ෂණයක් ඔස්සේ එළඹෙන නිගමනයක් නොවන්නේ පහත කුමක් ද?
(1) පෘථිවිය ආසන්නයේ පොළවට වැටෙන වස්තුවක ගුරුත්ව ත්වරණය නියතය.
(2) පොළව මට්ටමින් ඉහළට යත්ම වායුගෝලීය පීඩනය ක්‍රමයෙන් අඩු වේ.
(3) ඝන වස්තු දෙකක් එකිනෙක පිරිමදින විට උෂ්ණත්වය වැඩි වේ.
(4) කිසියම් ස්ථාන දෙකක දී වස්තූන් දෙකක බර සමාන නම් ඒවායේ ස්කන්ධ ද සමාන වේ.
(5) අයිස් දියවන අවස්ථාව පවතින උෂ්ණත්වය 0^0C වේ.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


Past Papers Wiki


43. භාරතීය තර්ක ශාස්ත්‍රයේ පරාර්ථානුමානයට අනුව "අනුමාන කරන දෙයට පාදක කර ගන්නා බාහිර ලෝකයෙන් ලබාගත් පාදක කරුණ හෝ කරුණු" දැක්වෙන්නේ,
(1) ප්‍රතිඥා වශයෙනි.
(2) හේතු වශයෙනි.
(3) උදාහරණ වශයෙනි.
(4) උපනය වශයෙනි.
(5) නිගමනය වශයෙනි.


44. තෝමස් කූන් ප්‍රකාශ කරන ආකාරයට විද්‍යාවේ අර්බුධකාරී අවධියේ සාමාන්‍ය ලක්ෂණයක් වන්නේ,
(1) පදනම් වාදයේ විෂමතාවයන් මඟ හැර සිටීමයි.
(2) ආකස්මික ලෙස විද්‍යා සමාජය තුළින් නව පැරඩයිමයක් මතු වීමයි.
(3) ප්‍රහේලිකා වියදමට අවශ්‍ය ඉඟි ලබා දීමයි.
(4) වාදයක අර්ථකථන ප්‍රාගුණයයි.
(5) නව පදනම් වාදයට නම්‍ය විය නොහැකි විද්‍යාඥයින් සමඟ තරුණ විද්‍යාඥයින් ගැටීමයි.


45. $\bar{A}\bar{B}\bar{C} + \bar{A}\bar{B}C + A\bar{B}C + A\bar{B}\bar{C} + \bar{A}BC + \bar{A}B\bar{C}$ යන සූත්‍රයේ සරල පරිපථය වන්නේ,

(1) 

(2) 

(3) 

(4) 

(5) 

46. ගැලීලියෝගේ නියමය ආනුභූතික සාමාන්‍යකරණයක් වන අතර නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ නියමය න්‍යායාත්මක සාමාන්‍යකරණයක් වන්නේ,
(1) නිව්ටන්ගේ නියමය ගැලීලියෝගේ නියමයෙන් ඔබ්බට යන නිසාය.
(2) නිව්ටන්ගේ නියමයෙහි සෘජුව ආනුභූතික නොවන සංකල්ප ඇති අතර ගැලීලියෝ නියමයෙහි එසේ නොමැති නිසාය.
(3) නිව්ටන්ගේ නියමය ගැලීලියෝගේ නියමයට වඩා පුළුල් නිසාය.
(4) නිව්ටන්ගේ නියමය ගැලීලියෝගේ නියමයට වඩා නිරවද්‍ය වන නිසාය.
(5) ගැලීලියෝගේ නියමය නිව්ටන්ගේ නියමයට වඩා සරල නිසාය.

47. නොආදාළත්වය පිළිබඳ ආභාස කාණ්ඩය යටතට ගැනෙන්නේ,
(1) යදෘච්ඡා ආභාසය
(2) අඥාන මූලික ආභාසය
(3) විලෝම යදෘච්ඡා ආභාසය
(4) න ගම්‍යතා ආභාසය
(5) ආප්ත ප්‍රමාණ ආභාසය

48. ස්වභාවික විද්‍යා ප්‍රපංචයක් ව්‍යාඛ්‍යානය කළ හැකි නමුත් සමාජීය විද්‍යා ප්‍රපංචයක් තේරුම් ගත යුතු හෝ අවබෝධ කර ගත යුතුය, යන්න දැක්වූයේ,

(1) විල්හෙල්ම් දිල්තේ හා එමිල් ධූර්කයිම්

(2) මැක්ස්වේබර් හා විල්හෙල්ම් දිල්තේ

(3) තෝමස් කූන් හා කාල් හෙම්පල්

(4) විල්හෙල්ම් දිල්තේ හා මැක්ස් වෙබර්

(5) මැක්ස්වේබර් හා මැක්ස් ප්ලාන්ක්

49. $\bar{A}B + \bar{A}\bar{C} + B\bar{C}$ යන බූලීය ප්‍රකාශනය ගුණිතයන්ගේ එකතුවක් ලෙස සම්මත ක්‍රමයෙන් ලියා දැක් වූ විට,

(1) $ABC + \bar{A}BC + \bar{A}\bar{B}C + \bar{A}B\bar{C}$

(2) $\bar{A}BC + \bar{A}B\bar{C} + \bar{A}\bar{B}\bar{C} + A\bar{B}\bar{C}$

(3) $\bar{A}BC + \bar{A}B\bar{C} + \bar{A}\bar{B}\bar{C} + AB\bar{C}$

(4) $\bar{A}BC + \bar{A}B\bar{C} + \bar{A}\bar{B}\bar{C} + AB\bar{C}$

(5) $\bar{A}\bar{B}C + \bar{A}BC + \bar{A}B\bar{C} + ABC$

50. පුරා විද්‍යාඥයකුට මානව විද්‍යා පරීක්ෂණයන්ට දායක විය හැකි අවශේෂ ක්‍රමයක් නොවන්නේ,

(1) ශාක අවශේෂ හා පොසිල ගත වූ මළ ද්‍රව්‍ය

(2) කර්මාන්ත හා කෘෂිකර්මය ආශ්‍රිත අවශේෂ

(3) මානවයා භාවිතයට නොගත් මෙවලම්

(4) සුසානභූමි හා ඒවායේ අවශේෂ

(5) මානව පොසිල හෝ සළකුණු හෝ පොසිලගත නොවූ සැකිලි කොටස්

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2025
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2025

13 ශ්‍රේණිය	24	S	II	තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය II	කාලය : පැය තුනයි Time : Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

උපදෙස් :

- පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II හා III කොටස් වලින් එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන තවත් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

සැලකිය යුතුයි:

* මෙම ප්‍රශ්න පත්‍රයෙහි තාර්කික නියත හා කර්මයන් සඳහා සංකේත භාවිත වන්නේ පහත දැක්වෙන ආකාරයට පමණි. පිළිතුරු සැපයීමේ දී ඒ අනුව සංකේත භාවිත කළ යුතු ය.

ප්‍රස්තුත හා ආඛ්‍යාත කලනයේ දී:

නිශේධනය: $\sim$, ගම්‍යය: $\rightarrow$, සංයෝජකය: $\wedge$, වියෝජකය: $\vee$, උභයගම්‍යය: $\leftrightarrow$

සර්වවාචී ප්‍රමාණිකෘතය: Λ, අස්තිවාචී ප්‍රමාණිකෘතය: V

වර්ග තර්ක ශාස්ත්‍රයේ දී:

A, B යන වර්ගයන්ගේ මේලය: $A \cup B$, ඡේදනය: $A \cap B$ හෝ AB, A වල අනුපූරකය: $\bar{A}$, විශ්ව වර්ගය: U, ශූන්‍ය වර්ගය: ϕ

බූලීය වීජ ගණිතයේ දී:

ඓක්‍යය: $+$, ගුණිතය: $\cdot$, X වල අනුපූරකය: $\overline{X}$, අගයන්: 1 සහ 0

තර්ක ද්වාරවල දී:

AND, OR, NOT, XOR ද්වාර පිළිවෙළින් A හා B ආදාන සඳහා $A \cdot B, A + B, \bar{A}, A \oplus B$

* වෙනත් තාර්කික නියත යොදා **නොගන්නා** ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

* ව්‍යුත්පන්න කිරීමේ දී ප්‍රමේයයන් (උදා: ඩි මෝර්ගන් ප්‍රමේයය) සහාය කර **නොගත යුතු ය.** ප්‍රමේයයන් සහාය කර ගත හැක්කේ අපේක්ෂකයා විසින් ඒවා සාධනය කරනු ලැබ ඇත්නම් පමණකි.

I කොටස

(1). I. "සියළු ගුරු දෙවිවරු දරුවන්ට යහපත සලසති" යන ප්‍රස්තුතයේ පංගු පරිවර්තනය දක්වන්න.

II. පහත සඳහන් ප්‍රකාශනයේ හිස්තැන් පිරවීම සඳහා වඩාත්ම ගැළපෙන පදය කුමක් ද?

කිසියම් වර්ගයක් හා එහි අනුපූරකයේ එකතුව ..... යි.

III. ප්‍රස්තුත කලනයේ දී යොදා ගනු ලබන ව්‍යුත්පන්න ක්‍රමවලට අමතරව ආඛ්‍යාත කලනයේ දී යොදා ගනු ලබන ව්‍යුත්පන්න ක්‍රමය කුමක් ද?

IV. පහත සඳහන් ප්‍රකාශය සත්‍ය ද? අසත්‍ය ද?

සප්‍රමාණ තර්කයක අවයව මෙන්ම නිගමනය ද අසත්‍ය විය නොහැකිය.

V. ප්‍රතිලෝම නියමයට අනුව පහත සඳහන් බූලීය ප්‍රකාශයන් සුළු කළ විට ලැබෙන ප්‍රතිඵලය පිළිවෙළින් දක්වන්න.

$A \cdot \bar{A}$

$A + \bar{A}$

VI. නිගාමී පද්ධතියක නිර්වචන නොදුන් පද ..... වන අතර එකී පද්ධතියේ සනාථ කිරීමෙන් තොරව පිළිගන්නා වගන්ති ..... වේ. මෙහි හිස්තැනට යෝග්‍ය වූ පද දෙක අනුපිළිවෙළින් ලියන්න.

VII. කාර්ල් පොපර් ප්‍රකාශ කරන ආකාරයට විද්‍යාවේ ආනුභූතිමය අන්තර්ගතය ගොඩ නැගෙන්නේ කුමක් මත ද?

VIII. වාදයක් ව්‍යාඛ්‍යානය කළ හැකි වුව ද නියම ව්‍යාඛ්‍යානය කිරීම අපහසුයි. එහෙත් වාදයක් තුළින් නියම ව්‍යාඛ්‍යානය වේ. ඒ අනුව ඩාවිනියානුවාදය තුළින් ව්‍යාඛ්‍යානය වන නියමය කුමක් ද?

IX. FATHER යන වචනයේ අකුරු පිළියෙළ කළ හැකි ආකාර ගණන කීයද?

X. "ආලෝකය ගුරුත්ව තරංගයක් ලෙස ගමන් කරයි." යන මතය දැක් වූ විද්‍යාත්මක න්‍යාය හා විද්‍යාඥයා කවුරුන් ද?

II කොටස

(2). (අ). සාම්ප්‍රදායික ප්‍රස්තුත වර්ගීකරණයේ ප්‍රමාණය හා ගුණය අනුව කෙරෙන සිව් වැදෑරුම් ප්‍රස්තුත උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 04)

(ආ). ගෝක්ලීනියානු සංක්ෂේපමාලාවල ස්වභාවය විස්තර කරන්න. (ලකුණු 02)

(ඉ). (i) සමමිතික සංක්‍රාන්තික සම්බන්ධය උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) පදයක් යනු කුමක්දැයි නිවැරදිව නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ඊ). (i) සරල ප්‍රස්තුතයක ලක්ෂණ මොනවාද? (ලකුණු 02)

(ii) තර්ක ශාස්ත්‍රීය ප්‍රස්තුතයක් යනු කුමක් ද? (ලකුණු 02)

(3). (අ). පහත සඳහන් සංවාක්‍ය සප්‍රමාණ ද නිෂ්ප්‍රමාණ ද යන්න, සාම්ප්‍රදායික සංවාක්‍ය රීති උපයෝගී කරගෙන නිශ්චය කරන්න.

සමහර දරුවෝ පාඩම් කරති.

පාඩම් කරන අය පාඩම් කියා දෙති. එබැවින් දරුවන් පාඩම් කියා දෙති. (ලකුණු 03)

(ආ). "සප්‍රමාණ සංවාක්‍යයක් තුළ විශේෂ ප්‍රස්තුතයක් අවයවයක් ලෙස ඇත්නම් නිගමනය සර්වවාචී විය හැකිද? නොහැකි ද?" යන්න සංවාක්‍ය රීති ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ඉ). පහත දැක්වෙන තර්කය වර්ග උපයෝගී කර ගනිමින් සංකේතයට නගා වෙන් රූප සටහන් මගින් එහි සප්‍රමාණතාව නිගමනය කරන්න.

සියළු බොරුකාරයින්ට වලිගයක් ඇත.

සියළු බොරුකාරයින් අනුන් මත යැපෙති.

වලිග ඇති සමහරු අනුන් මත යැපෙති.

∴ බොරු කාරයින් සිටිති. (ලකුණු 03)

(ඊ). සියළු හාවුන් අහිංසකය. සියළු හාවුන්

නිල් ඇස් ඇත්තන් ය. එහෙයින් සමහර

නිල් ඇස් ඇත්තන් අහිංසකය.

යන තර්කය සංවාක්‍ය මගින් මෙන්ම වර්ග මගින් සමර්තනය කරන්න. මෙම තර්කය පිළිබඳ ඔබට කුමක් කිව හැකි ද? (ලකුණු 05)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(4). (අ). පහත ප්‍රමේයන් සාධනය කරන්න.

I. $\forall xFx \rightarrow ((\wedge x(Fx \rightarrow Gx) \rightarrow \forall yGy))$

II. $(P \rightarrow Q) \rightarrow ((P \vee R) \rightarrow (Q \vee R))$ (ලකුණු 2 x 2 = 04)

(ආ). පහත දැක්වෙන තර්කය සංකේත කර එහි සප්‍රමාණතාවය සත්‍ය චක්‍ර වක්‍ර ක්‍රමයෙන් නිගමනය කරන්න.

විභාගය බදුල්ලේ පැවැත්වූවොත් පමණක් එය මහ විද්‍යාලයේ පැවැත්වේ. විභාගය බදුල්ලේ නොපැවැත්වෙයි. ඉදින් විභාග ශාලා පරීක්ෂකයින් ගාල්ලේ අය වේ නම් විභාග අපේක්ෂකයින් ගාල්ලේ අයයි. එහෙයින් මහ විද්‍යාලයේ විභාගය පැවැත්වෙන්නේ නැත.

(ලකුණු 04)

(ඉ). පහත සඳහන් තර්කය සංකේත කර ව්‍යුත්පන්න ක්‍රමයෙන් සප්‍රමාණතාව දක්වන්න.

සමහරු විනිසුරුවන් නම් හැමෝම නීතිඥයින් ය.
සමහරු නඩු විසඳයි නම් සමහරු නඩු කතා කරති.
මහේෂ් විනිසුරුවෙකු මෙන්ම නඩු විසඳන්නෙකි.
∴ සමහර නීතිඥයින් නඩු කතා කරති. (ලකුණු 04)

(ඊ). පහත සඳහන් තර්කයන්හි සප්‍රමාණතාව රුක් ක්‍රමයෙන් සාධනය කරන්න.

I. ඉදින් චීනස් ආලෝකය විහිදුවයි නම් එවිට එය පෘථිවිය අසල වේ. ඉදින් ඒ පෘථිවිය අසල වන්නේ චීනස් මත ජීවීන් ඇත්නම් පමණි. එහෙයින් ඉදින් චීනස් මත ජීවීන් නැත්නම් එවිට එය ආලෝකය විහිදුවන්නේ නැත. (ලකුණු 02)

II. සමහර පිරිමි කොණ්ඩය වවති. කොණ්ඩය වවන පිරිමින් සමහරෙක් කැපී පෙනෙන්නට උත්සාහ දරති. එහෙයින් සමහර පිරිමින් කැපී පෙනෙන්නට උත්සාහ දරයි. (ලකුණු 02)

(5). (අ). I. සංකේත තර්ක ක්‍රමයෙහි භාවිත වන $\forall$, $\wedge$ හා නියති පද සඳහා භාවිත වන බූලියානු සංකේත මොනවාද? (ලකුණු 02)

II. බූලීය ප්‍රකාශන තර්ක ද්වාර මගින් පෙන්නුම් කිරීමේ දී භාවිත වන මූලික ද්වාර මොනවාද? (ලකුණු 02)

III. සාර්ව ද්වාරය යනු මොනවා ද? (ලකුණු 02)

(ආ). I. ඔබේ පියවර ලියා දක්වමින් පහත සඳහන් බූලීය ප්‍රකාශනය සුළු කරන්න.

$\bar{x}y\bar{z} + \bar{x}yz + x\bar{y}z + xyz + \bar{x}y\bar{z}$ (ලකුණු 02)

II. ඉහත සරල කරන ලද ප්‍රතිඵලය සඳහා කානෝ සිතියම අඳින්න. (ලකුණු 02)

III. ඉහත I හි සුළු කළ සූත්‍රය සඳහා තර්ක ද්වාරය ගොඩනඟන්න. (ලකුණු 02)

(ඉ). ~(x↔y) යන සූත්‍රයට සර්ව සම වන "OR" න්‍යෂ්ටිය ලෙස ඇති බූලියානු ප්‍රකාශනය සොයා එහි තර්ක ද්වාරය අඳින්න. (ලකුණු 02)

(6). (අ). පහත සඳහන් තර්කාභාස හඳුනාගෙන පැහැදිලි කරන්න.

I. මුහුණු පොත හරහා ඔබ වෙත එන මෙම පණිවිඩය මිතුරන් අතර බෙදා නොගෙන මහ හැර ගිය මහාධිකරණ විනිසුරුවෙකු සතියක් තුළ හෘදයාබාධයකින් මිය ගියේ ය. අතපසු නොකොට මෙම පණිවිඩය මිතුරන් අතර බෙදා හැරියේ නම් ඔහු අද ජීවතුන් අතර ය.

II. "ධනවාදය වැඩ කරන ජනතාවට හානි කරන, ආර්ථික සංවිධානයේ තර්ක ස්වරූපයක්" යැයි ප්‍රකාශ කිරීමෙන් කාල් මාක්ස්ට වැරදුණා විය හැකිය. මක් නිසාද යත් ඔහු තම පවුලේ නඩත්තුවටවත් මුදල් උපයාගත නුහුණු පරාජිත මිනිසෙකු වූ හෙයිනි.

III. අයින්ස්ටයින් ඔහුගේ කාලයෙහි සිටි ප්‍රධාන භෞතික විද්‍යාඥයා වූ අතර ඔහු ක්වොන්ටම් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ කොපන් හේගන් අර්ථකරණයට විරුද්ධ විය. එහෙයින් ක්වොන්ටම් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ කොපන්හේගන් අර්ථකරණයේ යම් වරදක් තිබිය යුතුමය.

(ලකුණු 3 x 3)

(ආ). දඩුවම් පිළිබඳ පහත සඳහන් විග්‍රහයන් පිළිබඳ අදහස් දක්වන්න.

I. ප්‍රතිඵලාත්මකවාදය

II. චරිතශෝධනවාදය (ලකුණු 04)

(ඉ). "අපරාධ නඩුවක දී පරිවේශනීය සාක්ෂි" ලණු පොටවල් ගණනාවකින් සෑදුණු කඹයකට සමාන වේ." ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 03)

III කොටස

(7). (අ). විද්‍යාවේ විධික්‍රමය සම්බන්ධයෙන් උද්ගමනවාදී තර්ක ව්‍යූහය, විද්‍යාඥයාගේ ප්‍රායෝගික ක්‍රියාමාර්ග සමඟ දක්වන අසමමිතිය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ). ලකටෝස්ගේ පර්යේෂණ වැඩසටහන් ක්‍රමය වෛඥාන්තර අරාජිකවාදයක් බවට ෆයරාබන්ඩ් කුමන ආකාරයට දක්වන්නේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ඉ). ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා අතර පවතින ද්විත්ව විභේදන රාමුව කොතරම් දුරට වලංගු වන්නේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

(8). (අ). පරීක්ෂණයට භාජනය වන වස්තුවේ සාධක පාලනය කිරීමකින් තොරව කරන පරීක්ෂණය නිරීක්ෂණය නම් ප්‍රත්‍යක්ෂ පරීක්ෂණ ක්‍රමය ඇතුළත් විය යුත්තේ නිරීක්ෂණයක් ලෙසය. පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ආ). "විද්‍යාත්මක උපන්‍යාසයක් සරල විය යුතුයි" විද්‍යාත්මක උපන්‍යාසයක සරල භාවය යන්න නිදසුන් තුළින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

(ඉ). පරිහානියට පත්වන වැඩසටහන් අත් නොහැර තව දුරටත් ගෙන යා හැකි බව ලකටෝස් පෙන්වා දෙයි. මෙය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(9). (අ). "පොපර්ගේ අර්ථයෙන් සමාජීය විද්‍යා න්‍යායන් අසත්‍යකරණය කළ නොහැක" මෙහි දී සමාජීය විද්‍යා ක්‍රමවේදය තුළ පැන නගින අර්ථය, ප්‍රෝකථනය කිරීමේ හැකියාව, පර්යේෂණයන්ට යොමු කිරීම වැනි ගැටළු ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ආ). "විධික්‍රමික වශයෙන් ඕනෑම එකක් වලංගුය." යන ෆයරාබන්ඩ් ගේ මතය ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා අතර පවතින වෙනස පිහිල් කරයි. කරුණු දක්වන්න. (ලකුණු 08)

(10).(අ). විද්‍යාවේ නිගාමී නීතිවේදිමය මාදිලිය ඔස්සේ ස්වභාවික සංසිද්ධියක් ව්‍යාඛ්‍යානය කරන ආකාරය දක්වන්න. (ලකුණු 04)

(ආ). විද්‍යාත්මක පරීක්ෂණයක් තුළ පරීක්ෂණ දෝෂ වළක්වා ගන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ඉ). මධ්‍යන අපගමනය හා සම්මත අපගමනය යන සංකල්ප නිදසුන් සහිතව හඳුන්වන්න. (ලකුණු 06)

(11).(අ). "ගුණාත්මක දත්ත ප්‍රමාණාත්මකව දැක්වීමෙහිලා මිනුම උපයෝගි වේ." ඒ අනුව,

I. මිනුමෙහි ලක්ෂණ

II. මිනුම් පරිමාණ වර්ග පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ආ). විද්‍යාත්මක ගවේෂණයෙහිලා නැතහොත් විද්‍යාත්මක උපන්‍යාස ගොඩනැගීමෙහිලා මිනුම් උපකරණවල කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

උසස් පෙළ - පෙරහුරු පරීක්ෂණය - 2025
තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය I


01. 3	11. 2	21. 2	31. 4	41. 3
02. 4	12. 3	22. 3	32. 3	42. 1
03. 3	13. 3	23. 3	33. 4	43. 2
04. 4	14. 2	24. 2	34. 4	44. 2
05. 2	15. 4	25. 5	35. 2	45. 5
06. 3	16. 2	26. 5	36. 5	46. 2
07. 4	17. 3	27. 2	37. 5	47. 1
08. 4	18. 5	28. 5	38. 4	48. 4
09. 4	19. 1	29. 4	39. 2	49. 3
10. 5	20. 5	30. 3	40. 1	50. 3

LOL
Book Store

වාරෙටම ඕන කරන පොත් එකපාර
ඕඩර් කරලා දැන් ගෙදරටම ගෙන්වා ගන්න

25% OFF
ALL BOOKS

**Including Exercise Books,
CR Books, and B5 Books**



ඕනෙම අභ්‍යාස පොතකට 25%ක විශේෂ වට්ටමක්

ORDER BOOKS FROM LOL BOOKS STORE

0372060110 **WWW.LOL.LK**

071 777 4440 (WhatsApp)

Cash On Delivery Available

ORDER GCE A/L SHORT NOTES, MODEL, REVISION BOOKS & PAST PAPERS IN SINHALA, ENGLISH & TAMIL MEDIUM





LOL BOOK STORE

CASH ON DELIVERY AND KOKO PAYMENT AVAILABLE

WHATSAPP - 0717774440

WEBSITE: WWW.LOL.LK

GET READY FOR YOUR A/Ls WITH LOL BOOK STORE!